**18-04-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් ඉගෙන ගන්නේ පියාත් සමඟමයි. ස්වර්ණමය යුගයේ අධිරාජ්‍යයට උරුමකම් කීමට නම් ඔබ අනිවාර්යයෙන්ම පාරිශුද්ධත්වයට පත් විය යුතුයි.

**ප්‍රශ්නය:** දරුවන් වන ඔබලා පමණක් දන්නා පියාගේ ක්‍රියාව කුමක්ද?

**පිළිතුර:** ඔබගේ පියා, පියාත්, ගුරුවරයාත්, ඒ වගේම සත්ගුරුත් වන බව ඔබ දන්නවා. චක්‍රයේ සංගම යුගයේ දී පියා පැමිණෙන්නේ පැරණි ලෝකය අළුත් කිරීමටයි. එකම එක ආදි සනාතන දෙවි දේවතා ධර්මය ස්ථාපනය කිරීමටයි. දරුවන් වන අපව මනුෂ්‍ය තත්ත්වයෙන් දේවතා තත්ත්වයට පත් කරවීමට පියා පැමිණ උගන්වනවා. දරුවන් වන අප හැරෙන්න වෙන කිසිම කෙනෙක් ඔහුගේ ක්‍රියාව දන්නේ නැහැ.

**ගීතය:** අහිංසකත්වයේ ස්වාමියා තරම් කිසිවෙක් අසහාය නැහැ ...

ඕම් ශාන්ති. දරුවන් වන ඔබලාට ඕම් ශාන්ති යන වචනයේ අර්ථය නැවත නැවතත් පැහැදිලි කර කියා දී තිබෙනවා. ඕම් යනු මම ජීවයක්ය. මෙය මගේ ශරීරයයි යන්නයි. ශරීරයටත්, මේ මගේ ජීවයයි කියා කිව හැකියි. ඔබ මගේයි කියනා ශිව බාබාත්, බාබා ඔබ මගෙයි කියා දරුවනුත් කියන්නාක් සේ ජීවයත් මේ මගේ ශරීරයයි කියා කියනවා. ඒ වගේම ශරීරයත් මගේ ජීවය කියා කියනවා. තවමත් අවිනාශියි කියා ජීවය දන්නවා. ජීවයකින් තොරව ශරීරයට කිසිවක් කරන්න බැහැ. ජීවයට ශරීරයක් තිබෙන නිසා මගේ ජීවයට කරදර කරන්න එපා කියා කියනවා. මගේ ජීවය පින්වත් ජීවයක්. නැතිනම් මගේ ජීවය පාපකාරි ජීවයක්. ජීව වන තමත් ස්වර්ණමය යුගයේ දී පින්වත් ජීව ලෙස සිටි බව ජීව වන ඔබලා දන්නවා. ජීවයම කියනවා, ස්වරණමය යුගයේ දී මම සතෝප්‍රධාන්. සැබෑම රත්රන් ලෙස සිටියා. ඇත්තටම ඒ රත්තරන් නොවෙයි. උදාහරණයක් ලෙස එසේ කියනවා. මගේ ජීව පාරිශුද්ධව ස්වර්ණමය යුගයේ කෙනෙක්ව සිටියා. ජීවය දැන් කියනවා මම අපිරිසිඳුයි. ලෝකයේ සිටිනා මිනිසුන්ට මෙය තේරෙන්නේ නැහැ. ඔබට ලැබෙන්නේ ශ්‍රීමත්ය. තමත් සතෝප්‍රදාන්ව සිටි බවත් දැන් තමෝප්‍රදාන් වී ඇති බවත් ජීව වන ඔබලා දැන් දන්නවා. සියල්ලටම එය එසේමයි: ළමා කාලය, වැඩිමහල් විය හා මහලු විය. සෑම දෙයක්ම අනිවාර්යයෙන්ම පැරණි තත්වයෙන් අළුත් වෙනවා. ලෝකයත් සතෝප්‍රදාන් ස්වර්ණමය යුගයට අයත් ලෙස පළමුව තිබුණා වුණත් පසුව එය තමෝප්‍රධාන් කලි යුගයට අයිති දෙයක් වුණා. සියළු දෙනාම සිටින්නේ දුකින් බව පේන්නේ මේ නිසායි. සතෝප්‍රධාන් යනු අළුත් වුණු ලෝකය වන අතර තමෝප්‍රධාන් යනු පළුදු වුණු ලෝකයයි. ගීතයේත්, පළුදු වුණු දේ අළුත් කරනා කෙනා කියා කියවෙනවා. පැරණි ලෝකය රාවන්ගේ රාජ්‍යය වන අතර එහි සියළු දෙනාම අපිරිසිඳු නිසා ඒ පැරණි ලෝකය දිරාපත් වෙලයි ඇත්තේ. ස්වර්ණමය යුගයේ දී සෑම කෙනෙක්ම පාරිශද්ධව සිටි අතර එය හැඳින්වූයේ නව පාපයෙන් තොර ලෝකයක් ලෙසයි. මෙය පැරණි පාපකාරි ලෝකයයි. දැන් මේ ඇත්තේ කලි යුගයයි. මේ කිසිවක් පාසලක හෝ විශ්ව විද්‍යාලයක උගන්වන්නේ නැහැ. දෙවියන් පැමිණ ඔබට රාජයෝගා උගන්වනවා. ගීතාවේ -දෙවියන්ගේ වදන් - සඳහන් වෙනවා: ශ්‍රිමත් හගවත් ගීතාව. ශ්‍රීමත් යනු උසස් උපදේශයනුයි. උසස්ම උසස්. ඉහළම ඉහළ කෙනා වන්නේ සත්‍යය දෙවියනුයි. ඔහුගේ හරි නම ශිවා යන්නයියි. - රුද්‍රා ජයතිය- හෝ - රුද්‍රා රාත්‍රිය ගැන ඔබ කවදාවත් අසා නැහැ. මිනිස්සු ශිව රාත්‍රිය ගැන කතා කරනවා. නමුත් ශිවා අශාරීරිකයි. ඉතින් එසේනම් එවත් අශාරිරික කෙනෙකුගේ උපත් දිනය සමරන්නේ කෙසේද? ක්‍රිෂ්ණාගේ උපන් දිනය සැමරීම හරි. ඔහු අහවල් අහවල් කෙනාගේ දරුවා. ඒ වගේම ඔහුගේ උපන් වේලාව, උපන් දිනය සඳහන් වී තිබෙනවා. ශිවා ඉපදුණේ කවදාද කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. මෙය දැනගත යුතුයි. සත් යුගය ආරම්භයේ දී ශ්‍රී ක්‍රිෂ්ණා උපත ලැබුවේ කෙසේද යන අවබෝධය දැන් ඔබට ලැබී තිබෙනවා. එය වසර 5000කට පෙර බව ඔබ කියනවා. ක්‍රිස්තුන් වහන්සේට වසර 3000කට පෙර භාරතය පාරාදීසයක්ව තිබුණු බවත් සඳහන් වී තිබෙනවා. ඉස්ලාම් ධර්මයට පෙර චන්ද්‍ර වංශය තිබුණු අතර ඊටත් පෙර තිබුණේ සූර්ය වංශයයි. ග්‍රන්ථ වල ස්වර්ණමය යුගයට වසර සිය දහස් ගණනක කාල පරිච්ඡේදයක් ලබා දී තිබෙනවා. ප්‍රධානම ග්‍රන්ථය ගීතාවයි. දේවතා ධර්මය ස්ථාපනය වූයේ ගීතාව මගිනුයි. එය ස්වර්ණමය යුගයේ සිට රිදී යුගය දක්වා පැතිරී තිබුණා. ඉන් අදහස් වන්නේ ආදී සනාතන දෙවි දේවතා ධර්මය ස්ථාපනය වූයේ උත්තරීතර පියා වන උත්තරිතර ජීවය විසින් ගීතාව මගින් යන්නයි. පසුව කල්ප බාගයක් පුරාම, කිසිදු ග්‍රන්ථයක් තිබුණෙත් නැහැ. කිසිදු ආගමික නායකවරයෙක් සිටියෙත් නැහැ. පියා පැමිණ බ්‍රහමින්වරුන්ව

දේවතාවරුන් හා ක්ෂත්‍රියයන් බවට පත් කෙරෙව්වා. ඉන් අදහස් වන්නේ පියා ආගම් තුනක් ස්ථාපනය කරනා බවයි. මෙය අධික ධර්මයයි. එහි කාලපරාසය ඉතාමත් කුඩායි. සියළුම ග්‍රන්ථ වලින් ඉතාමත් උසස්ම ග්‍රන්ථය වන ගීතාව ගායනා කළේ දෙවියනුයි. පියා නැවත උපත් ගන්නේ නැහැ. ඔහු උපත් ගන්නවා. නමුත් ඔහු කියන්නේ: මම ගර්භාෂයකට ඇතුළු වන්නේ නැහැ කියලයි. මම පෝෂණය ලබන්නේ නැහැ. ස්වර්ණමය යුගයේ උපත ලබනා දරුවන් මාළිගාවක් වන් වූ ගර්භාෂයක ජීවත් වන අතර රාවන්ගේ අධිරාජ්‍යයේ දී ඔවුනට යාමට සිදු වන්නේ සිරකුටියක් වන් වූ ගර්භාෂයකටයි. කළ පාපයන්ට සිර ගෙදර දී දඬුවම් විඳීමට සිදු වෙනවා. තමන් තවත් පව් කරන්නේ නැහැයි කියා ඔවුන් ගර්භාෂයේ දී පොරොන්දු වුණත් මෙයත් පාපකාරී ජීවයන්ගේ ලෝකයයි. දරුවා එළියට පැමිණි සැණකින්ම (ඉපදුණු සැණකින්ම) ඔහු පව් කිරීමට පටන් ගන්නවා. එහි දී වුණු පොරොන්දුව අතහැර දමනවා. මෙහිදීත් තමත් තව දුරටත් තමන් පව් කරන්නේ නැහැ. රාගය නම් වූ අසිපත එකිනෙකා මත යොදවන්නේ නැහැයි කියා බොහෝ දෙනා පොරොන්දු වෙනවා. මන්ද ඒ පාපය ආරම්භයේ පටන් මැදටත්, අවසානය දක්වාත් ගෙන දෙන්නේ දුක්මයි. ස්වර්ණමය යුගයේ කිසිදු වසක් නැහැ. එමනිසා. උපත් 21ක් පුරාවටම මුල, මැද සිට අග දක්වාම ඔබ කිසිදු දුකක් වේදනාවක් විඳින්නේ නැහැ. මන්ද එය දෙවියන්ගේ අධිරාජ්‍යයයි. පියා නැවතත් වතාවක් එම ස්ථාපනය කරගෙන යනවා. ස්ථාපනය සිදුවන්නේ සංගම යුගයේ දී පමණයි. නැද්ද? ආගමක් ස්ථාපනය කිරීමට පැමිණෙන කිසිවෙක් කිසිදු පාපයක් නොකෙළ යුතුයි. ඔවුන්ගේ කාලයේ එක් භාගයක් පින්වත් ජීව ලෙස සිටි ඔවුන් ඉතිරි භාගයේ දී පාපකාරී ජීව වෙනවා. ස්වර්ණමය හා රිදී යුගයහි දී ඔබලා පින්වත් ජීව ලෙස සිට පසුව පාපකාරී ජීව බවට පත් වෙනවා. සතෝප්‍රධාන් ජීවයක් ඉහළ සිට පැමිණි විට ඔහුට දඬුවම් විඳින්න බැහැ. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවය ආගමක් ස්ථාපනය කිරීමට පැමිණි විට, ඔහුට දඬුවම් විඳීමට සිදු වුණේ නැහැ. ක්‍රිස්තුන් වහන්සේ කුරුසයේ ඇණ ගැහුවා කියා ඔවුන් කිව්වත්, ඒ ජීවය කිසිදු පාපකාරී ක්‍රියාවක් කර නැහැ. එම ජීවය ඇතුළු වන ශරීරය තමයි වේදනාව විඳිමින් සියල්ල ඉවසන්නේ. ඒකත් බාබා මොහුට ඇතුළු වෙනවා හා සමානයි. බාබා සතෝප්‍රධාන්. කුමන හෝ වේදනාවක් හෝ අපහසුතාවයක් අත්විඳින්නේ මොහුයි. ශිව බාබා නොවෙයි. ඔහු නිරන්තරයෙන් සාමකාමීව හා සතුටින් සිටිනවා. ඔහු සදා සතෝප්‍රධාන් තත්ත්වයේයි සිටින්නේ. කොහොම නමුත්, ඔහු ඒත් ඇතුළු වන්නේ මේ මහලු ශරීරයටයි. ඒ ලෙසින්ම, ක්‍රිස්තුන් වහන්සේ ඇතුළු වන ශරීරය වේදනාව විඳිනා නමුත් ක්‍රිස්තු ජීවය වේදනාවක් විඳින්නේ නැහැ. මන්ද ඔහු සතෝ, රජෝ හා තමෝ මට්ටම් පසුකර යා යුතුයි. අළුත් ජීව පහළට පැමිණෙනවා. එමනිසා ඔවුන් අනිවාර්යයෙන්ම පළමුවෙන්ම සතුටම අත්විඳිය යුතුයි. මුලින්ම ඔවුන්ට දුක් විඳීමට සිදු වන්නේ නැහ: නීතිය එය නොවෙයි. බාබා අසුන් ගෙන සිටින්නේ මොහු තුළයි. ඕනෑම අපහසුතාවක් විඳීමට සිදු වන්නේ මොහුටයි. බාබාට නොවෙයි. කොහොම නමුත්, මේ දේවල් ගැන දන්නේ ඔබ පමණයි. වෙන කිසිම කෙනෙක් ඒවා ගැන දන්නේ නැහැ. පියා මෙහි ඉඳ මේ සියළුම රහස් ඔබට කියා දෙනවා. මෙම පහසු රාජයෝගාව තුළින් ස්ථාපනය සිදුවන අතර ඒ දේවල්ම භක්ති මාර්ගයේ දීත් නැවතත් සිදු වෙනවා. සංගම යුගයේ සිදු වන ඕනෑම දෙයක් සිහිවටනයක් වෙනවා. භක්ති මාර්ගය ඇරඹුණු විට ශිව බාබාව වන්දනාවට ලක් වෙනවා. පළමුවෙන්ම භක්තිය කළේ කවුද? ලක්ෂ්මී හා නාරායන් අධිරාජ්‍යය පාලනය කරනා විට ඔවුන් පූජනීයයි. පසුව ඔවුන් පාපකාරී මාවතට වැටුණු විට, වන්දනීය තත්ත්වයේ සිටි අය වන්දනා කරනා අයගේ මට්ටමට වැටෙනවා. පියා පැහැදිලි කර කියා දෙනවා: අශාරීරික උත්තරීතර පියා වන උත්තරීතර ජීවය මොහු හරහා දරුවන් වන ඔබලාට උගන්වනවාය යන්න දරුවන් වන ඔබලාගේ සිහියට ඇතුළු විය යුතුයි. මේ ආකාරයෙන් පැහැදිලි කරනා තැනක් මුළු ලෝකයේම වෙන කොහේවත් නැහැ. නැවතත් වතාවක් පැමිණ භාරතයට දිව්‍ය ලෝකයේ උරුමය ලබා දෙන්නේ පියා පමණයි. ත්‍රිමූර්ති පින්තූරයේ පහළින් ලියා තිබෙනවා: දේවතා ලෝක අධිරාජ්‍යය ඔබගේ සත්‍යය පියාගේ ජන්ම උරුමයයි. ශිව බාබා පැමිණ දරුවන් වන ඔබලාව වඩාත් සුදුසු අය බවට පත් කරවා දිව්‍ය ලෝකයේ උරුමය ලබා දෙනවා. බාබා තමන්ව තවත් සුදුස්සන් බවට පත් කරවනවාය කියා ඔබ දන්නවා. ඔබලා සිටියේ අපිරිසිඳුවයි. නැද්ද? අපි පාරිශුද්ධ වුණු විට, මේ ශරිර ඉතිරි වන්නේ නැහැ. අපව අපිරිසිඳු කරවන්නේ රාවනුයි. පසුව උත්තරීතර පියා වන උත්තරීතර ජීවය අපව පාරිශුද්ධ කරවා පාරිශුද්ධ ලෝකයේ පාලකවරුන් බවට පත් කරවනවා. ඔහු දැනුමේ සාගරය සේම පාරිශුද්ධකරුවාණනුයි. ඒ අශාරීරික බාබා අපට උගන්වනවා. සෑම කෙනෙක්ටම එකට ඉගෙන ගන්න බැහැ. ඇත්තටම මෙහි අසුන් ගෙන සිටින්නේ ඔබලාගෙන් කිහිප දෙනෙක් පමණයි. අන් සෑම දරුවෙක්ම ශිව බාබා දැන් බ්‍රහ්මාගේ ශරීරයේ සිට ලෝකයේ මුල, මැද හා අග පිළිබඳ වූ දැනුම ලබා දෙනවාය කියා අවබෝධ කර ගෙන සිටිනවා. ඔවුන්ට ඒ මුරලිය ලිඛිතව ලැබේවි. අනිකුත් ආධ්‍යාත්මික කණ්ඩායම් වල එය එසේ නොවෙයි. මේ දින වල, පටිගත කිරීමට යන්ත්‍රයක් නිපදවා තිබෙනා නිසා ඔවුන් මෙය පටිගත කර කැසට් පටයක් යවනවා. අහවල් අහවල් ගුරු මෙය කියනවා කියා කියනවා. ඔවුන්ගේ සිහියේ ඇත්තේ

මනුෂ්‍යයෙක් පමණිය. එය මෙතැනට අදාල නැහැ. මෙහි, දැනුමින් පිරි කෙනා වන්නේ අශාරීරික පියායි. මිනිසුන්ට දැනුමින් පිරි කෙනෙක් කියා කියන්න බැහැ. සත්‍ය පියා දැනුමින් පිරි සාමයෙන් පිරි හා ආනන්දයෙන් පිරි කෙනා කියා කියනවා. එමනිසා ඔහු මඟින් උරුමයක් ලැබේවි. ඔහුගේ දරුවන්ට ඔවුන්ගේ ගුණධර්ම ලැබෙනවා. ඔබලා දැන් එය ලබනවා. අපි ගුණධර්ම උකහා ගෙන ලක්ෂ්මී හා නාරායන් වෙනවා. සැම කෙනෙක්ම රජ හෝ රැජිණ වෙන්නේ නැහැ. රජවරුන්, රැජිණියන් හා උපදේශකවරුන් ගැන කියැවෙනවා. අධිරාජ්‍යාවරයා හා අධිරාජ්‍යාවරිට බලය තිබෙන නිසා උපදේශකවරුන් අවශ්‍ය වන්නේ නැහැ. උපදේශකවරුන් අවශ්‍ය වන්නේ ඔවුන් පාපකාරී වුණු විටයි. මීට පෙර කිසිදු ඇමතිවරයෙක් ආදී කෙනෙක් සිටියේ නැහැ. එය තිබුණේ එකම එක රජ කෙනෙකුගේ හා රැජිණියකගේ අධිරාජ්‍යය වශයෙනුයි. ඇයි ඔවුන්ට උපදේශකවරුන් අවශ්‍ය? ඔවුන්ම පාලකවරුන් ලෙස සිටි නිසා ඔවුන්ට උපදේශ ගැනීමේ අවශ්‍යතාවයක් තිබුණෙ නැහැ. මෙය ඉතිහාසය හා භූගෝලයයි. කොහොම නමුත්, පළමුවෙන්ම, පියා සියල්ල කර ඔබට යෝගා උගන්වනවා. ස්මරණ වන්දනාවේ නිරතව සිටින්න. නාටකය දැන් අවසන් වෙමිනුයි තිබෙන්නේ. අප පාපයේ ගැලී සිටි නිසා සම්පූර්ණයෙන්ම අපිරිසිඳු වෙලා. මෙන්න මේ නිසායි - පාපකාරී ජීව- කියා කියන්නේ. ස්වර්ණමය යුගයේ කිසිදු පාපකාරී ජීවයක් නැහැ. එහි සිටින්නේ පින්වත් ජීව පමණයි. ඔබ දැන් දරනා උත්සාහයට ලැබෙනා ප්‍රතිලාභය එයයි. මෙය ඔබගේ ස්මරණ වන්දනාවයි. එය හඳුන්වන්නේ භාරතයේ යෝගාව කියලයි. කොහොමනමුත්, යෝගා යනුවෙන් හැඳින්වෙන්නේ පාප දුරු කරවනා ස්මරණයයි කියා ඔවුන් තේරුම් ගන්නේ නැහැ. පසුව ඔබ ඔබගේ ශරීරය අතැර දමා නිවහන වෙත යාවි. එය හඳුන්වන්නේ මිහිරි නිවහන කියලයි. ජීවය කියනවා: මම ඒ සාම දේශයේ වැසියෙකුයි. අපි එහි සිට අශාරීරිකව පැමිණි අතර, අපට අදාල චරිත රඟදැක්වීම සඳහා මෙහි පැමිණ ශරීර ගත්තා. පස් පව් කියන්නේ මායා කියාත් පැහැදිලි කර කියා දී තිබෙනවා. මේවා පංච භූතයනුයි. රාගය හා කෝපය යන භූතයිනුත් සිටිනවා. භයානකම භූතයා ශාරීරික අවධානයයි. පියා පැහැදිලි කරනවා: මෙම පාප ස්වර්ණමය යුගයේ පවතින්නේ නැහැ. එය හඳුන්වන්නේ පාපයෙන් තොර ලෝකය කියලයි. පාපකාරී ලෝකය පාපයෙන් තොර ලෝකය බවට පත් කරවීම පියා පමණක් අයිති කාර්යයි. සියළු බල ඇත්තා, දැනුමේ සාගරය හා පාරිශුද්ධකරු වන්නේ ඔහු පමණයි. මේ කාලයේ සැම කෙනෙක්ම උපදින්නේ දූෂණයෙන්. ස්වර්ණමය යුගයේ දී පමණයි ලෝකය පාපයෙන් තොරව තිබෙන්නේ. පියා කියනවා: ඔබ දැන් පාපකාරී තත්වයෙන් පාපයෙන් තොර තත්ත්වයට පත් විය යුතුයි. මේ පාපයෙන් තොරව දරුවන් බිහි වන්නේ කෙසේද කියා ඔවුන් අසනවා. පියා පැහැදිලි කර කියනවා: මේ ඔබගේ අවසන් උපතයි. මරණීය දේශය අවසන් වීමටයි යන්නේ, ඉන් අනතුරුව කිසිදු පාපකාරී පුද්ගලයෙක් ඉතිරි වන්නේ නැහැ. මෙන්න මේ නිසා තමයි තමන් පාරිශුද්ධව සිටිනවා කියා ඔබ පියාට පොරොන්දු විය යුත්තේ. ඔවුන් කියනවා: බාබා, මම අනිවාර්යයෙන්ම මගේ උරුමය ඔබගෙන් දිනා ගන්නම්. මිනිස්සු බොරු දිව්රුම් දෙනවා. ඔහු පැමිණෙන්නේ කවදාද කෙසේද කියා ඔවුන් දන්නේ නැහැ. ඔහුගේ, නම, රූපය, දේශය හා කාලය ගැන ඔවුන් දන්නේ නැහැ. පියාම පැමිණ තම හැඳින්වීම ලබා දෙනවා. ඔබට දැන් ඔහුගේ හැඳින්වීම ලැබෙනවා. ලෝකයේ සිටිනා වෙන කිසිම කෙනෙක් සත්‍යය, පියාව දන්නේ නැහැ. ඔවුන් ඔහුට යාඥා කරනවා, වන්දනා කරනවා. නමුත් ඔහුගේ රැකියාව දන්නේ නැහැ. උත්තරීතර පියා වන උත්තරිතර ජීවය, තමාගේ පියා, ගුරුවරයා හා සත්ගුරු බව ඔබ දැන් දන්නවා. මේ පියාම ඔබට ඔහුගේ හැඳින්වීම ලබා දී තිබෙනවා. ඔහු කියනවා: මම ඔබගේ පියායි. මම මේ ශරීරයට ඇතුළු වී සිටිනවා. ප්‍රජාපිතා බ්‍රහ්මා මාර්ගයෙන් ස්ථාපනය සිදු වෙනවා. කාගේ ස්ථාපනය ද? බ්‍රහමින්වරුන්ගේ. බ්‍රහමින්වරුන් වන ඔබලා ඉගෙන ගැනීමෙන් දේවතාවරුන් බවට පත් වෙනවා. මා පැමිණ ඔබව ශූද්‍ර තත්ත්වයෙන් බ්‍රහමින් තත්ත්වයට පත් කරවනවා. පියා කියනවා: මම චක්‍රයේ සංගම යුගයේ දී පැමිණෙනවා. චක්‍රය වසර 5000ක් දිගයි. මේ ලෝක චක්‍රය දිගටම කැරකෙනවා. පැරණි ලෝකය අළුත් කර ආදි සනාතන දේවතා ධර්මය ස්ථාපනය කිරීම සඳහා මා පැමිණෙනවා. පසුව මම සියළුම පැරණි ආගම් විනාශ කර දමනවා. දරුවන් වන ඔබලාට මා උගන්වා උපත් 21කටම මානව තත්ත්ව යෙන් දේවතා තත්වයට පත් කරවනවා. දේවතාවරුන් සූර්ය වංශිකයි, චන්ද්‍ර වංශිකයි, ඔවුන්ගේ පුරවැසියනුත් ඒ වගේයි. කොහොමනමුත්, ඔබට උසස් තත්වයක් දිනා ගත හැකි වන්නේ ඔබ දැන් දරනා උත්සාහයට අනුවයි. දැන් ඔබ කොපමණ දුරක උත්සාහයක් දරනවා ද සැම කල්පයක දීම එය එසේම වේවි. තමන් සැම කල්පයකදීම එම උත්සාහය දැරූ බවත් තමන්ට ඒ අදාල තත්වය හිමි වන බවත් ඔබට තේරෙනවා. තමාට උගන්වන්නේ අශාරීරික කෙනා ය යන්න දරුවන් වන ඔබලාගේ සිහියේ තිබෙනවා. ඔබලාගේ පව් දුරු වන්නේ ඔහු සිහි කිරීමෙන් පමණයි. ඔහුව සිහි කිරීමෙන් තොරව ඔබගේ පාප දුරු වෙන්නේ නැහැ. තමන් උපත් කීයක් ගන්නවා ද කියාවත් මිනිස්සු දන්නේ නැහැ. උපත් මිලියන 8.4ක් ගැන කෙනෙක් බොරු කතාවක් ග්‍රන්ථ වල ලියා තිබෙනවා. ඇත්තේ උපත් 84ක් බව ඔබට දැන් තේරෙනවා. මේ

ඔබගේ අවසන් උපත වන අතර පසුව ඔබ දිව්‍ය ලෝකය වෙතට යනවා. පළමුව ඔබ අශාරීරික ලෝකයට ගොස් පසුව දිව්‍යලෝකය වෙතට යනවා. අච්ඡා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පාරිශුද්ධව සිටීමට ඔබ පියාට වුණු පොරොන්දුව මත ස්ථාවරව සිටින්න. රාගය හා කෝපය යන භූතයන්ගෙන් ඔබ අනිවාර්යෙන්ම ජය ලබා ගත යුතුයි.
2. එහේ මෙහේ යන එන ගමන් සියල්ලම කරනා ගමන්, ඔබට උගන්වනා පියාව සිහිපත් කරන්න. නාටකය දැන් අවසන් වෙමිනුයි යන්නේ. එමනිසා, මෙම අවසාන උපතේ දී ඔබ අනිවාර්යයෙන්ම පාරිශුද්ධත්වයට පත් විය යුතුයි.

**වරදානය:** ඔබ සියලු වස්තු වලින් පිරිපුන් වී ඔබේ මුහුණ සැබෑ සේවාධරියකු ලෙස සේවය කරත්වා.

සියලු වස්තු වලින් නිරන්තරයෙන් පිරිපුන් වී සිටින දරුවන්ගේ ඇස්වල සහ නළලෙහි දිව්‍යමය කුල්මත් බව දිස්වෙයි. ඔවුන්ගේ මුහුණු සේවය සිදුකරයි. ඔවුන් ස්වල්පයක් හෝ ගොඩක් රැස් කරගෙන තිබුණත්, එය ඔවුන්ගේ මුහුණු වල දිස්වේ. කෙනෙකු උසස් වංශයකට අයත් වූ විට, එම දීප්තිය සහ කුල්මත් බව ඔහුගේ හෝ ඇයගේ මුහුණේ දිස්වේ. එලෙසම, ඔබේ මුහුණෙන් ඔබේ සෑම සිතිවිල්ලක්ම සහ ක්‍රියාවක්ම හෙළිදරව් කිරීමට ඉඩ හරින්න, එවිට ඔබ සැබෑ සේවාධාරියෙකු ලෙස හඳුන්වනු ඇත.

**පාඨය:** ඔබේ කාලය සහ සිතිවිලි වල නිධානයන් සුරකින්න, එමගින් ඔබේ එක්රැස් කිරීමේ ගිණුම වැඩි කර ගන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

ඔබ යමෙකුට මිහිරි දෙයක් දෙන විට, ඔහුගේ හෝ ඇයගේ මුව කෙටි කාලයකට මිහිරි වේ. කෙසේවෙතත්, ඔබම මිහිරි වූ විට, ඔබේ දෙතොලගෙහි සෑමවිටම මිහිරි වචන තිබේවි. ඔබ මිහිරි දෙයක් කන විට හෝ යම් කෙනෙකුට දෙන විට, ඔබ සතුටු වන ආකාරයටම, ඒ ආකාරයෙන්ම, මිහිරි වචන ඔබට සහ අන් අයට සතුටු හැඟීමක් ඇති කරවයි. මේ ආකාරයෙන් සෑම කෙනෙකුගේම මුව මිහිරි කරවීම දිගටම කරගෙන යන්න. ඔබේ දෘෂ්ටිය, වචන සහ ක්‍රියාවන් සෑමවිටෙකම මිහිරි වීමට ඉඩ හරින්න.